**ශීර්ෂය 8 - ජාතික පොලිස් කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2015 වර්ෂය**

---

ශීර්ෂය 8 - ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 26 දින කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

කොමිෂන් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 47.03 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 41.18 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 5.85 ක් හෙවත් සියයට 12.44 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 45.68 | 40.37 | 5.31 | **11.62** |
| මූලධන | 1.35 | 0.80 | 0.55 | **40.74** |
| **එකතුව** | **47.03** | **41.18** | **5.85** | **12.44** |

**2.2 අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභාවට අදාල විෂයය අංක 00801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 2.00 | 1.51 | 1.30 | 1.54 | 7.00 | 4.61 |

**2.3 විගණන නිරීක්ෂණය**

ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛනය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**3.2 විසර්ජන ගිණුම**

**-------------------**

**අයවැය විචලනය**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 13 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක සිට සියයට 95 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.100,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

**3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**--------------------------------------**

**3.3.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**------------------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2015 වර්ෂයට සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**3.3.2 අභ්‍යන්තර විගණනය**

------------------------

ජාතික පොලිස් කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.3.3 විගණන හා කළමනාකරණ කමිටුව**

**--------------------------------------**

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**---------------------------**

කොමිෂන් සභාවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් ඌනතාවයන් අනාවරණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**--------------------------------------------**

වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු ඉවත් කළ යුතු දෑ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

------------------------------

2015 දෙසැම්බර් 31 දිනට රු.346,037 ක් වූ බේරුම් නොකළ බැරකම් පැවතියද විසර්ජන ගිණුමෙහි බේරුම් නොකළ බැරකම් ලෙස රු.251,742 ක් සඳහන් කර තිබුණි. ඒ අනුව රු.94,295 ක බැරකම් අඩුවෙන් විසර්ජන ගිණුමේ දක්වා තිබුණි.

**3.5** **කාර්යසාධනය**

**---------------**

කොමිෂන් සභාවේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** **කොමිෂන් සභාව අක්‍රීයව පැවති කාලය**

**-----------------------------------------**

කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ නිල කාලය 2015 පෙබරවාරි 21 දින අවසන් වීමෙන් පසු 2015 ඔක්තෝබර් 15 දින වන විටත් නැවත සමාජිකයින් පත් නොකිරීම නිසා මාස 08 ක් පමණ කාලයක් කොමිෂන් සභාව අක්‍රියව පැවතුණි. එම කාල සීමාවේදී කොමිෂන් සභාව පිහිටවීමෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු කර නොතිබුණි.

**(ආ)** **පැමිණිලි විමර්ශනය**

**-----------------------**

ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යාල 11 ක් වෙත සමාලෝචිත වර්ෂයේදී පහත පරිදි පැමිණිලි 467 ක් ලැබී තිබුණි.

| **පැමිණිල්ලේ ස්වභාවය** | **පැමිණිලි සංඛ්‍යාව** |
|---|---|
| පොලිසිය විසින් ක්‍රියා නොකිරීම | 150 |
| පහරදීම | 10 |
| වධහිංසා පැමිණිවීම | 02 |
| බලය අයථා ලෙස පරිහරණය | 113 |
| කාන්තාවන්ට හා ළමුන්ට හිංසා කිරීම | 108 |
| වෙනත් | 34 |
| අල්ලස් දූෂණ | 02 |
| පක්ෂග්‍රාහීවීම | 08 |
| බොරු චෝදනා කිරීම | 19 |
| නීතිවිරෝධී ලෙස රඳවා ගැනීම | 21 |
| **එකතුව** | **467** |

සමාලෝචිත වර්ෂයේදී එම පැමිණිලිවලින් 76 ක් හෙවත් සියයට 16 ක් විසඳා තිබුණු අතර පැමිණිලි 391 ක් හෙවත් සියයට 84 ක් විසඳා නොතිබුණි.

**3.6** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව  තථ්‍ය සේවක සංඛ්‍යාව**

**---------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 25 | 03 | 13 | 09 |
| තෘතියික මට්ටම | 03 | 01 | - | 02 |
| ද්විතියික මට්ටම | 50 | 32 | 02 | 16 |
| ප්‍රාථමික මට්ටම | 16 | 12 | - | 4 |
| **එකතුව** | **94** | **48** | **15** | **31** |